# කැලෑ කඳවුර





නෙතුමි සවිත්මා සෙනරත් බණ්ඩාර

5 B

# fmr jok

සාහිත්‍යය ohKj rgl ixjධර්නය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි, යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර් ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# කැලෑ කඳවුර

නෙතුම් සවිත්මා සෙනරත් බණ්ඩාර

අපි දෙන්නා යාළු

2025-02-08

ISBN NO 978-624-208-619-4

එකමත් එක කාලෙක ලිලී සහ ජෝන් කියලා සහෝදරයෝ දෙන්නෙක් හිටියා. අක්කගෙ නම ලිලී.මල්ලි තමයි ජෝන්. එයාලට පාසල් නිවාඩුව ලැබුනා.අම්මයි තාත්තයි හිතුවා මෙවර නිවාඩුවට පුංචි කැලෑවක් බලන්න යන්න ඕන කියලා.ලිලීටයි ජෝන්ටයි හරි සතුටුයි. ඒ වගේම කැලෑවල අත්දැකීම් ලැබූ කතාවල තිබුණු සිදුවීම් ඔවුන්ට මතක් වුනා.ඔවුන් නිතරම එවැනි අත්දැකීම් ගැන කතා කරමින් කැලෑවට යන දිනය එනතුරු නොයිවසිල්ලෙන් බලා සිටියා.



දිනක් අම්මා සහ තාත්තා දරුවන්ට කතාකරලා "අපි

හෙට තමයි කැලෑව බලන්න යන්නේ ගමනට අවශ්‍ය කරන සියලුම දේවල් සූදානම් කරගන්න"යි දරුවන්ට කිව්වා.දෙන්නටම හරිම සතුටුයි.දෙන්නම උඩපැන්නා. අම්මව බදාගත්තා.ඊලඟට තාත්තා කියපු දේ ඇහුවම දෙන්නම මූනෙන් මූන බලාගත්තා.ඇස් උඩ ගියා.කට ඇරුනා.දෙන්නම දෙන්නව බදාගත්තා.

මොකක්ද දන්නවද තාත්තා ඒ දෙන්නට කිව්වේ."අපි කැලේ දවස් දෙකක් නතර වෙනවා" කියලා."අපි කොහෙද තාත්තේ නිදාගන්නේ".

ලිලී පුදුමයෙන් ඇහුවා."අපි නවතින්නේ කූඩාරමක."
"අපට ආරක්ෂාව දෙනවා.බයවෙන්න දෙයක් නෑ.
ජෝන් එක්වරම අම්මාගේ මූන දෙස බැලුවේ ඒ ගමනේ භයානක කමක් තියනවා නම් අම්මා නිසැකවම විරුද්ධ වන බැවිනි.ඒත් අම්මාගේ මුහුනේ එවැනි භයානක කමක් නොතිබුනු බැවින් ඔවුන් දෙදෙනාටම කියා නිම කළ නොහැකි සතුටක් ඇතිවිය.ලිලී කාමරයට දිව ගොස් ඇඳුම් සොයන්නට විය.



පසුදින දහවල් 10 පමණ වන විට කැලෑ කඳවුරට ඔවුන් ලඟා වුනා. ඔවුන්ගේ ආරක්ෂක නිලධාරියා ඔවුන්ව කූඩාරම වෙත එක්කන් ගියා. ලස්සන ඔයකින් ගොඩවෙලා ගිය ඒ පාර හරිම ලස්සනයි.පුංචි මැෂින් බෝට්ටුවකින් ඔවුන් කැලෑවේ සුන්දරත්වය බලන්න ගියා.ජෝන් හොඳින් බෝට්ටුව පදවන හැටි බලාහිටියා. එයා හරිම ආසාවෙන් බෝට්ටුව පැදවූ මාමාත් සමග යාලු වෙලා බෝට්ටුව පදින්න ඉගෙනගත්තා.



කූඩාරම තිබුනේ හරිම ලස්සන තැනක. වටේම ලස්සනට පේනවා.එයාලා කවදාවත් මෙච්චර ලස්සන තැනක ඉඳලා නෑ."අර බලන්න තාත්තේ අර උඩහ ලස්සන පිට්ටනියක්.

"එතන අපිට හොඳට සෙල්ලම් කරන්න පුලුවන්.අනේ තාත්තේ යමුකෝ."දැන් හවස් උනානේ පුතේ අපි හෙට උදේ යමුකෝ."

එයාලා ගෙනාපු බඩු අස්කරගෙන කෑම කාලා අවට සිරි නරඹන්න පටන්ගත්තා.ඉර බහින වේලාවේ වටේම තිබුණු ලස්සන රතුපාට අහස එයාලව වෙනම ලෝකෙකට අරගෙන ගියා.



"මල්ලී අපි ගිනි මැලයක් ගහමුද?"

"හා නියමයි"

"තාත්තේ අපි ගිනිමැලයක් ගහමුද?"

"හොඳයි අපි අහලා බලමු"

තාත්තා ආරක්ෂක නිලධාරීන්ගෙන් අසා ඔවුන්ගේ උදව් ඇතිව ගිනිමැලයක් සාදා සියලුදෙනාම සිංදු කියන්න පටන් ගත්තා.

ලිලීටයි ජෝන්ටයි හරිම සතුටුයි.

එදින රෑ සීතල පරිසරය එයාලට නුවරඑළිය සිහිපත් කළා.හොඳින් බූල් ඇදුම් ඇඳගත්ත ලිලී සහ ජෝන් කූඩාරම ඇතුලේ විවිධ භූත කතා කියමින් සතුටින් නිදාගත්තා.

පසුදා උදේම ලිලී ජෝන් දෙදෙනා බෝට්ටුව ළඟට දුවගෙන ඇවිත් බෝට්ටුව"අක්කේ මට පුලුවන් බෝට්ටුව පදින්න අපි යමුද."

" පිස්සුද මල්ලී පෙරලුනොත් එහෙම අපි දෙන්නම ඉවරයි."

"නෑ අක්කේ මේ ඔය ගැඹුරු නැහැනේ අපිට ඕනනම් ඇවිදගෙන යන්නත් පුල්වන්."ඒ උනාට බැහැ මල්ලී.මට නම් බයයි."

"ඔයා බය නැතිව ඉන්නකෝ ඒ අංකල් මට හොඳට මේක පදින හැටි කියලා දුන්නා."



එහෙම කියපු මල්ලී ආරක්ෂක ඇදුම් දෙකකුත් අරගෙන දෙන්නම ඇඳගෙන බෝට්ටුව පණ ගන්වලා හෙමින් ඉදිරියට ගියා."අක්කා දඟලන්නැතුව ඉන්නකෝ."

මල්ලී බෝට්ටුව ගෙන යන පරිස්සම දැක්ක ලිලීට මල්ලී ගැන විශ්වාසයක් ඇතිඋනා.අර ලස්සන පිට්ටනිය ළඟට එනකොට මල්ලී බෝට්ටුවේ වේගය අඩු කරලා හෙමින් අයිනට කරලා නැවැත්තුවා.ලිලීට මල්ලී ගැන ආඩම්බර හිතුනා.දෙන්නම හෙමින් බෝට්ටුවෙන් බැහැලා පිට්ටනියට දුවලා ගියා.හැමතිස්සෙම ඇහෙන කුරුලු සද්දෙ නිසා එයාලට පාලුවක් හිතුනෙත් නැහැ. දෙන්නා කොයිතරම් සතුටු උනාද.



දෙන්නම බිම පෙරලි පෙරලි සෙල්ලම් කළා."මල්ලී මෙහෙම තැනක අපි කවදාවත් සෙල්ලම් කරලා නැහැ නේද?

"හරිම ශෝක්....මල්ලී අර පඳුර ළඟ මොකෙක්ද අර.... හා පැටියෙක් නේද? ළඟට ගිහින් බලමුද? "



"අක්කේ එයාට ඇවිදින්න බැහැ වගේ කකුලේ තුවාලයක් නේද?අයියෝ මල්ලී අපි බෙහෙත් ගෙනාවේ නැහැනේ.අපි මෙයාව අරගෙන ගිහින් බෙහෙත් දාමු.

උදේ නැගිටලා ළමයි දෙන්නට කතා කරපු අම්මා කලබල උනා.රූ නිදි වරාගෙන හිටපු තාත්තට හොඳටම නින්ද ගිහින් තිබුණා.අම්මා කලබලයෙන් තාත්තාව කීද්දුවා.

"මේ බලන්කෝ බබාලා නැහැනේ මම වටේටම කතා කරලා බැලුවා....අනේ නැගිටින්නකෝ "



"ඔය ලඟට යන්න ඇති බලන්න ඒක ගැමුරු නැහැ බය වෙන්න එපා"

කියපු තාත්තා අනිත් පැත්ත හැරිලා නිදාගත්තා.අම්මා කඳවුරේ හිටපු ආරක්ෂක නිලධාරීන් ඉන්නවාදැයි බලන්න ගියා.එයාලත් තවම නිදි වගේ.

අම්මා කලබලයෙන් එහෙ මෙහෙ බැලුවා.

ඒත් එක්කම තාත්තා නැගිටලා ඇවිත්

"හිටියේ නැද්දැයි "අහලා හයියෙන් " ලිලී.... ජෝන් ..." කියලා කෑ ගැහුවා.

ඒ සද්දෙට ළමයි කතා නොකළත් ආරක්ෂක නිලධාරීන් එතැනට ආවා."ඇයි සර් ...කලබලයෙන්...

"ළමයි දෙන්නා නැහැනේ."

ඒ අතරම අම්මා බෝට්ටුව නැති බව දැක්කා.එහෙමත් එකට මේ දෙන්නා බෝට්ටුව පැදගෙන ගියාද?අම්මා හොඳටම බය උනා."බයවෙන්න එපා මැඩම් මේ ඔය ගැඹුරු නැහැ.අපි ගිහින් බලමු."

"මල්ලී එයා බයවෙයිද? "

"මගේ ස්කාෆ් එකේ ඔතාගමු."අපි දැන් යමුද මල්ලී අම්මා බය වෙලා ඇති."

ඒත් එක්කම බෝට්ටු සද්දයක් ඇහුනා."දෙයියනේ අන්න තාත්තලා එනවා.මල්ලී අපි දැන් මොකද කරන්නේ? "බයවෙන්න එපා තාත්තා බනින්නෑ."

ඔය ගැඹුරු නැති නිසයි මම ආවේ කියලා තාත්තා දන්නවා.

"ආ මහත්තයා ඕකට තමයි බෝට්ටු පදින්න අහගත්තේ නේද? "

ජෝන් අහිංසක විදිහට හිනාඋනා.අම්මා දුවගෙන ඇවිත් දෙන්නවම බදාගත්ත



හැමෝම ආපහු කඳවුරට ගියා.ගස් නැග්ගා. ඔංචිලි පැද්දා.වීව් පොයින්ට් වලට ගියා.කැලෑවේ ලස්සන තැන් බැලුවා. දිය පාරවල් දිගේ ඇවිදගෙන ගියා. හා පැටියට බෙහෙත් දාලා ආපහු පිට්ටනියට ගෙනියනකොටම ඉස්සරහින් ලොකු හාවෙක් දිව්වා.හා පැටියත් විදුලි වේගෙන් ඒ පැත්තට දිව්වා.අනේ එයාගෙ අම්මනේ ඇවිත් තියෙන්නේ. හා පැටියා අම්මත් එක්ක කැලේ පැත්තට දිව්වා.දෙන්නට හරි සතුටුයි.ආපහු ආවේ හරිම ආඩම්බරයෙන්.අම්මේ පැටියගෙ අම්මා හම්බුනා. දෙන්නම කැලේට දිව්වා.



මගේ ළමයි දෙන්නා දැන් හරි හපන්නු තාත්තා ඒ දෙන්නව ආදරයෙන් වැළඳගත්තා.හරිම අපූරු කැලෑ කඳවුරේ දවස් දෙකක්ම ගත කරපු ඔවුන් හරිම සතුටින් ගෙදර ආවා. ගෙදර ගිහින් කරපු වැරදි වැඩේට බැනුම් අහන්න වෙන බව නම් දෙන්නම දැනගත්තා.ගෙදර ඇවිත් යාලුවෝ හැමෝටම කඳවුරේ විස්තර කිව්වා. හැමෝම හරිම ආසාවෙන් කතාව අහගෙන හිටියා.

"අපි ඊළඟ සැරේ යාලුවොත් එක්කම යමුකෝ "තාත්තා කිව්වා.හැමෝම සතුටු උනා.

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍යය නිමර්ාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර් ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව කියාත්මක පාසල් දරුවන් ගන්ථකරණයට යොමුකරන කියාමූලික පර් යේෂණ ව්‍යාපෘතිය යටතේ ාම් වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි වැඩි පමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා කියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන්, ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ පණාමය හිමිවිය යුතුය.

මුදිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ පධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර් ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු පශ්න නිර් මාණය වීමට හේතු වී ඇති බව පර් යේෂණාත්මක ව සනාථ විය.මෙයට පිළියම් වශයෙන් කියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුධිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර් ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර ගණනාවක සිට රටේම දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර් මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසඟ සාහිත්‍ය නිර් මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර් මාණ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්,

# නිමි ....